''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 3051-4924**
https://journals.sjp.ac.lk/index.php/pumithiri
**වෙළුම: 2; II කලාපය; 2025 නොවැම්බර්; පිටු: 37-50**

# ශ්‍රී ලංකා ජාතික දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්. (2010-2024 පාර්ලිමේන්තු කාන්තා නියෝජනය ආශ්‍රයෙන්)

**කේ. එම්. වී. රවිහාරි[1], වී. එස්. සූරියබණ්ඩාර[2] සහ කේ. බී. සී. මධුෂාන්[3]**
[1,2,3]දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
vigesharaviharik@gamil.com

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය කාන්තාවගේ දේශපාලන සහභාගිත්වය පිළිබඳ සාකච්ඡාව ආරම්භ විය යුත්තේ ම විවාදාත්මක ප්‍රවේශයකිනි. එයට හේතුව වශයෙන් දැක්විය හැක්කේ 1931 සිට 2024 දක්වා ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකය වන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය කිසිදු අවස්ථාවක 10, ඉක්ම වූ සාධනීය මට්ටමක් කරා ළඟා නොවීමයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී දේශපාලන සහභාගිත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් යන මැයෙන් කරන ලද අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ 1931 සිට මෙරට පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතුණේ ඇයි ද? යන්න අධ්‍යයනය කිරීම වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ නම් , ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතීමට අදාළ හේතු සාධක 2010 - 2024 පාර්ලිමේන්තු මැතිවරණ ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය, 3352 ක් පමණ ඡන්දදායකයන් සිටින මොරකැටිය ග්‍රාම නිලධාරී වසම තුළ, එයින් පිරිමි පාර්ශ්වයෙන් 20 දෙනකු හා කාන්තා පාර්ශවයෙන් 30දෙනෙකු සහිත ව දත්ත දායකයන් 50 දෙනෙකු නියැදිය ලෙස ගෙන එම දත්ත මත පදනම්ව සිදු කරන ලදී. දත්තදායකයින් වෙත විවෘත ප්‍රශ්න මාලාවක් දී එමඟින් දත්ත ලබාගන්නා ලදී. ලබාගත් ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යාලේඛන විධික්‍රමය යටතේ MS Excel මෘදුකාංගය යටතේත්, ගුණාත්මක දත්ත ගුණාත්මක ප්‍රවේශය යටතේත් විග්‍රහ කිරීම සිදු විය. පවතින සමාජ සංස්කෘතික ආකල්ප, දේශපාලන තරඟයේ දී සිදුවන චරිත ඝාතන, දේශපාලන පවුල් පසුබිම, පවතින මැතිවරණ ක්‍රමය, දේශපාලනයේ ප්‍රචණ්ඩ ක්‍රියා, ආර්ථික අපහසුතා කාන්තා නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතීමට බෙහෙවින් බලපාන සාධක බව සොයාගන්නා ලදි. කෝටා ක්‍රමයක් හඳුන්වා දීම, ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම පිළිබඳව ඡන්දදායකයන් දැනුවත් කිරීම, දේශපාලනික සවිඥානය සහිත උගත් කාන්තාවන්ට පමණක් නාමයෝජනා ලබා දීම යනාදි ය හරහා මෙම තත්ත්වය මඟහැරවා ගැනීමට හැකි බව අධ්‍යයනයේ දත්ත මත පෙන්වා දිය හැකිය.

**මුඛ්‍ය පද:** කාන්තා නියෝජනය, දේශපාලන සහභාගිත්වය, පාර්ලිමේන්තුව, මැතිවරණ

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සමාජයක වැදගත් අංගයක් ලෙස දේශපාලන සහභාගිත්වය හැඳින්විය හැක. දේශපාලන සහභාගිත්වය තුළ ස්ත්‍රී පුරුෂ භේදය, ජාතිභේදය, මානව වර්ග හෝ කුල භේද යන ආදියෙන් තොරව සෑම පුරවැසියකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට ත් මැතිවරණ ක්‍රියාවලියට තරඟකරුවකු ලෙස ඉදිරිපත් වීමටත් හැකියාව තිබිය යුතුය. මේ ආකාරයට දේශපාලන සහභාගීත්වය යනු ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව හිමිවිය යුතු තත්වයකි. "සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක දී එහි පංගුකරුවන් වන සියලුම ස්ත්‍රීන් හා පුරුෂයින් ට සමාන අයුරින් එහි පාලනයට සහභාගි වීමේ හැකියාව තිබිය යුතුය. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට මෙබඳු සමාන පංගුකාර ක්‍රමයක් නොලැබේ නම් එය අසම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයකි." (ලියනගේ, 2012). එක්සත් ජාතීන්ගේ ප්‍රගති වාර්තාවට අනුව දේශපාලන ක්‍රියාවලියේ දී ස්ත්‍රීන්ගේ බලපෑම අර්ථවත්ය යන්න තහවුරු කිරීමට නම් දේශපාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 30% ක් වත් විය යුතුය යන්න තීරණාත්මක සාධකයක් ලෙස සැලකේ.

කාන්තාව හා කාන්තාවගේ දේශපාලන නියෝජනය පිළිබඳව ලෝකය පුරා බොහෝ රටවල සමාජ සන්දර්භ වල විවිධ මතිමතාන්තර දරන සහ ආන්දෝලනාත්මක කතා බහට ලක්වන මාතෘකාවකි. (මනුරත්න2004:219). දැනට ලෝකයේ පාර්ලිමේන්තු තුළ බහුතර කාන්තා නියෝජන ප්‍රතිශතයක්

දිනාගෙන ඇත්තේ රුවන්ඩා වන අතර එය 61. 3 % කි. ඊට අමතරව කියුබාව, නවසීලන්තය, මෙක්සිකෝව, ස්වීඩනය කාන්තා නියෝජන ප්‍රතිශතය 40 % ට වැඩි අගයක් දිනාගත් රටවල් ලෙස හැඳින්විය හැක. නමුත් ලෝකයේ බොහෝ රටවල සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් වන්නේ පාර්ලිමේන්තු හෙවත් ලෝකයේ බොහෝ රටවල ව්‍යවස්ථාදායකයන් තුළ දේශපාලන නියෝජනය තුළ පුරුෂයන්ට සාපේක්ෂව කාන්තා නියෝජනය අඩු මට්ටමක පැවතීමයි. (මඩහපොළ , 2004).1956 දි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට පත්කළ මන්ත්‍රීවරියක වීමේ වරම ලැබුණි. අනතුරුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1960 මැතිවරණයෙන් ලංකාවේ අගමැතිකමට පත් වූ අතර ලෝකයේ කාන්තාවක් ප්‍රථම වරට අගමැතිනිය ලෙස පත් වූ අවස්ථාව හේතුවෙන් ඇය ගිනස් වාර්තා පොතට ද ඇතුළත් වූයේ , එය ශ්‍රී ලංකා කාන්තා දේශපාලන නියෝජනයේ උච්චතම අවස්ථාව සනිටුහන් කරමිනි. ඉන් අනතුරුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 1994 මෙරට ජනාධිපති ධූරයට පත් වී දෙවතාවක් ධූරය දරන ලදි. එමෙන්ම ශ්‍රී ලංකාවේ 2004 පාර්ලිමේන්තු මැතිවරණය තුළ දී මුළු ආසන 225 න් කාන්තා නියෝජිතයින් 13ක් ද , 2010 මැතිවරණයේදී කාන්තාවන් 13ක් ද, 2015 මැතිවරණයේදී 13 ක් ද, 2020 මැතිවරණයේ දී කාන්තා නියෝජිතයින් 12ක් ද ,2024 මැතිවරණයේ දී කාන්තා නියෝජිතයින් 22ක් ද වශයෙන් තේරී පත් විය.

පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය සමස්තයක් ලෙස ගත් කළ 1948 නිදහස ලැබීමේ සිට 2024 දක්වාම කිසිදු අවස්ථාවක 10% ඉක්මවා ගොස් නැත. 1977 දි එය 6.5% ක් වූ අතර එතැන් සිට 2020 දක්වා මෙම ප්‍රතිශතය ඉහළ ගොස් නැත. 2024 දී එය 9.8% ක් විය. දකුණු ආසියාවේ රටවල් අතුරින් ප්‍රථමයෙන්ම සර්වජන ඡන්ද බලය දිනා ගැනීමට ශ්‍රී ලාංකික ස්ත්‍රීන් සමත් වී, එසේම ලොව ප්‍රථම අගමැතිනිය බිහි කිරීමේ ගෞරවය ද ලංකාවට හිමි වී, ශ්‍රී ලංකා කාන්තාවගේ සාක්ෂරතා මට්ටම ද 91% ක් තිබිය දී 2024 දක්වාම ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය 10%ක මට්ටමක් වැනි අවම අගයක පැවතීම උභතෝකෝටික ප්‍රශ්නයකි. මෙම ආකාරයට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පසුබෑමට ලක්වීමේ ගැටලුව සමාජමය වශයෙන් ප්‍රබල අවධානයකට ලක් විය යුතු කාරණාවක් ලෙස නිර්වචනය කළ හැක.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනයේ ප්‍රභවය හා ඓතිහාසික විකාශනය දෙස බැලීමේ දී කලාපීය රාජ්‍යයන් ට සාපේක්ෂව ප්‍රගතිශීලී ක්‍රියාකාරීත්වයක් මූලාරම්භය තුළ දී දක්නට ලැබේ. නමුත් ශක්තිමත් මූලාරම්භයක් සහ කාන්තාවකට දේශපාලනික ප්‍රවේශයට අවශ්‍ය වාතාවරණයක් මෙරට නිර්මාණය වී තිබුණත් ලාංකේය කාන්තාවන්ගේ දේශපාලන නියෝජන වර්ධනයක් පෙන්නුම් නොකිරීම අතිශයින්ම අර්බුදකාරී ගැටලුවකි. මෙහිදී ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය 1931 සිට පසුගාමී තත්ත්වයක පවතින්නේ ඇයි ද? යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ අරමුණු**

දැ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය පසුගාමී තත්ත්වයක පවතින්නේ ඇයි? ද යන්න අධ්‍යයනය කිරීම.

**උප අරමුණු**

- කාන්තා නියෝජනය කෙරෙහි දේශපාලන පවුල් පසුබිමේ හා ජනප්‍රියත්වයේ බලපෑම කෙතෙක් දුරට වැදගත් දැයි විමසා බැලීම (2010 සිට 2020 දක්වා පැවති පාර්ලිමේන්තු මැතිවරණ ආශ්‍රයෙන්).
- මෙරට කාන්තාවන්ට පාර්ලිමේන්තු නියෝජන අවස්ථා ලබා ගැනීමේ දි පවතින සාධනීය ලක්ෂණ හා අභියෝග කවරේදැයි විමසා බැලීම.
- පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය වර්ධනය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග හා කාන්තා නියෝජනය වර්ධනය කිරීමෙන් සලසා ගත හැකි වාසි අධ්‍යයනය කිරීම.

**සාහිත්‍යය විමර්ශනය**

ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය පසුගාමී තත්ත්වයක පවතින්නේ ඇයි ද ? යන ගැටලුව පිළිබඳව අධ්‍යයනය කරනු ලබන මෙම පර්යේෂණය හරහා මූලිකවම අවධානය යොමු කළ යුතු න්‍යායාත්මක ක්ෂේත්‍රයන් ද්විත්වයක් හඳුනා ගත හැකිය. ඒ අනුව කාන්තාව හා දේශපාලනය මෙන්ම ලාංකේය කාන්තාවගේ දේශපාලන සහභාගිත්වය යන න්‍යායාත්මක ක්ෂේත්‍ර පදනම් ව මෙහි සාහිත්‍ය විමර්ශනය සිදු කළ හැකිය. කාන්තාව හා දේශපාලනය යන්න විශාල ආන්දෝලනාත්මක කතාවකට ලක් වූ මාතෘකාවක් වන අතර ඒ පිළිබඳ න්‍යායාත්මකව අවධානය යොමු කිරීමේදී විවිධ

ප්‍රවේශයන් ඔස්සේ සිදුකරන ලද අධ්‍යයනයන් රාශියක් හඳුනා ගැනීමට හැකිව තිබේ. (සමාජ විමසුම, 17)එහිදි කාන්තාව හා දේශපාලනය පිළිබඳ අධ්‍යනය කිරීමේ දී කාන්තාවාදී ක්‍රියාකාරකම් සංවිධානාත්මක ව්‍යාපාරයක් ලෙසට 19වන සියවසේ දෙවන භාගයේ දී ආරම්භ වූ අතර මුලින් සමාන දේපල අයිතිය හා හා සමාන විවාහ ගිවිසුම් තිබිය යුතු බවට තර්ක කරමින් කාන්තාවන් තම අයිතිවාසිකම් දිනා ගැනීම පිළිබඳ අවධානය යොමු කලත් 19 වන සියවසේ අවසානය වන විට කාන්තාවන්ගේ මූලික අවශ්‍යතාවය බවට පත් වූයේ දේශපාලන බලය ලබා ගැනීමයි. මේ තුළින් ලෝක දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වයේ විකාශනය සාකච්ඡා කරයි. නමුත් මෙමගින් කාන්තා නියෝජනය වර්ධනය කිරීමට ගත යුතු සාධනීය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත්තේ සීමිත ආකාරයට ය.

එමෙන්ම කාන්තාව හා දේශපාලනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ස්ත්‍රී පුරුෂ දේශපාලන සමානාත්මතාවය පිළිබඳ 1948 එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය දෙවන වගන්තිය මගින් මෙලෙස අවධාරණය කරයි. ''කෙලින්ම හෝ නිදහස්ව තෝරාගත් නියෝජිතයන් මගින් තම රටේ රජයට සහභාගි වීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත. එමගින් දේශපාලන නියෝජන අයිතිය ස්ත්‍රීන් හා පුරුෂයන්ට සමානව ලේඛනගත කොට හිමිකර දී තිබේ". මෙම කෘතියෙහි තවදුරටත් සඳහන් කර තිබෙන්නේ දැනට ලෝකයේ පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය ඉහළම ප්‍රතිශතය දිනා ගෙන තිබෙන්නේ රුවන්ඩාව වන අතර එය 56% ක් ලෙස විශිෂ්ට අගයක් ගන්නා අතර ස්වීඩනය, කියුබාව, පින්ලන්තය යන රාජ්‍යවල ද පාර්ලිමේන්තු නියෝජනය 40% ප්‍රතිශතය ඉක්මවා තිබෙන බවයි. මේ තුළින් ලෝක දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වයේ ඉහළ ම රාජ්‍යයන් පිළිබඳ අවධාරණය කරයි. (ලියනගේ, 2012). වනිතා දේශපාලනය කෘතිය තුළින් ඉදිරිපත් කරනුයේ 1995 වන විට ලෝක මට්ටමින් කාන්තාවන් ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය කළ ප්‍රතිශතය 11% ක් ලෙස ගණන් බලා ඇත යනුවෙනි. මේ තුළින් ලෝක දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වයේ වර්ධනය පිළිබඳ සාකච්ඡා කළ ද යාවත්කාලීන දත්ත ලබා ගැනීම අසීරු විය.

දකුණු ආසියාතික කලාපයේ රටවල් අතරින් ශ්‍රී ලංකාව සෙසු රාජ්‍ය වන නේපාලය, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය, බංගලාදේශය, ඉන්දියාව, මාලදිවයින යන රාජ්‍යවලට පහල කාන්තා සංයුතියක් පාර්ලිමේන්තුව නියෝජනය කරයි. දකුණු ආසියානු රටවල් අතරින් ශ්‍රී ලංකාව සමාජ සංවර්ධන දර්ශක වලින් ඉහළම අගයක් බොහෝ අංශ වල දී දිනාගෙන තිබේ. ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සාක්ෂරතාව 91% කි. විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී නියෝජනය 62% කි. පාසල්වල ගැහැණු ළමයි 53%කි. ලාංකික ස්ත්‍රිය සමාජ හා ආර්ථික වශයෙන් එබඳු විවිධ ජයග්‍රහණ ලබා තිබුණ ද ඇගේ දේශපාලන නියෝජනය අවම අගයක් ගනී. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය 1948 නිදහස ලැබීමේ සිට මේ දක්වා කිසිදු අවස්ථාවක 10% ඉක්මවා ගොස් නැත. 2020 දක්වාම එය 6.5 % ක් විය.මේ තුළින් ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා දේශපාලන නියෝජනය ලංකාවේ කාන්තාවගේ සාක්ෂරතා මට්ටම මත සතුටුදායක විය නොහැකි බව අවධාරණය කර ඇත. (ලියනගේ, 2012).

"ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබාදීම ඌරන් ඉදිරිපිට මුතු විසිකිරීමකි" යනුවෙන් පොන්නම්බලම් රාමනාදන් මහතා පවසා තිබේ" (මඩහපොළ, 2004). මේ අනුව ලාංකීය සමාජයේ ස්ත්‍රී දේශපාලන නියෝජනය පිළිබඳ දරන ලද හණමිටි අදහස් මෙම අර්ථකථනය මඟින් මනාව විද්‍යමාන වේ. මෙම ආකාරයට අතීතයේ මෙන්ම වර්තමානයේ දේශපාලනයට පිවිසි ස්ත්‍රීන් හැල්ලුවට ලක් කිරීම නිසා මෙරට කාන්තා දේශපාලන සහභාගිත්වය අවම වී තිබෙන බව මෙමගින් ප්‍රකාශිත ය.පාර්ලිමේන්තු ක්‍රමය තුළ සාමාජික සංඛ්‍යාව 225 ක් වීමේ දී 1989 පටන් මේ දක්වා කාන්තා නියෝජිතයන් ගණන 22 ඉක්මවා ගොස් නැත. මෙරට සමස්ත ජනගහනයෙන් 49.3% ක් පිරිමින් ද, 50.7% ක් පමණ කාන්තාවෝ සිටිති. මෙයින් පෙනෙන්නේ පිරිමි ජනගහනයට වඩා කාන්තාවන් වැඩියෙන් සිටින බව ය. එසේ වුවත් රටේ ක්‍රියාකාරී දේශපාලන ව්‍යුහය තුළ කාන්තාවට කිසිදු අවස්ථාවක වැඩි නියෝජන අවස්ථා ලැබී නැත. මේ තුළින් ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා දේශපාලන නියෝජනය මෙරට ස්ත්‍රී ජනගහනය සමග සසඳන විට හා අතීත පසුබිම දෙස බලන විට අවම මට්ටමක පවතින බව අවධාරණය කරයි.

නිරන්ජනී මෙන්ඩිස් විසින් රචිත කෝටා ක්‍රමයකින් හෝ ආසන ප්‍රමාණයක් වෙන්කිරීම මගින් කාන්තාවන් යම් ප්‍රමාණයක් දේශපාලනයට තල්ලු කළ හැකිය නැමති ලිපියෙහි, සමස්තයක් ලෙස ලෝක දේශපාලනයේ තුළ කුමන රටකවත් 50% ට

50% ක කාන්තා සහභාගිත්වය දකින්න නොලැබෙන අතර බොහෝ රටවල් මේ දේ තේරුම්ගෙන විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. එම නිසා ඒ රටවලට කාන්තා නියෝජනය වර්ධනය කිරීමට හැකි වී තිබේ. උදා÷ ස්කැන්ඩිනේවියානු රටවල් තුළ කාන්තා නියෝජනය 36% ක් 40% ක් දක්වා වර්ධනය කර ඇත්තේ කෝටා ක්‍රමයක් හඳුන්වා දීමෙනි. ලංකාවේ පවතින සමානුපාතික නියෝජන ක්‍රමය හේතුවෙන් මැතිවරණයක් සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමට සිදුවීම මෙන්ම දේශපාලනය අපරාධ සමග සම්බන්ධ වී තිබීම නිසා අවශ්‍ය ප්‍රමාණයට වඩා බලයක් නියෝජිතවරියක් බවට පත්වන්නට අවශ්‍ය වේ. බොහෝ කාන්තාවන්ට ඒ දෙකටම ශක්තියක් නැත. එබැවින් ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා දේශපාලන නියෝජනය වර්ධනය කිරීමට රාජ්‍ය යාන්ත්‍රණය වැඩපිළිවෙලක් දියත් කළ යුතු බව සාකච්ඡා කරයි. . එහි දි වැඩපිළිවෙල යටතේ කෝටා ක්‍රමයක් හඳුන්වා දීම කෙරෙහි ම වැඩි නැඹුරුවක් දක්වා ඇති ආකාරය ඉස්මතු වී පෙනේ.

ලෝකයේ පළමු රාජ්‍ය නායිකාව බිහිකිරීමේ ගෞරවය ද ආඩම්බරය ද ශ්‍රී ලංකාව අත් දකිමින් සිටි. රාජ්‍ය නායිකාවක බිහිකර ගැනීමේ ආසන්න අස්ථාව 2016 දී අහිමිකරගත් ඇමරිකා එක්සත් ජනපදයට පිළිතුරු ලෙස නිදහසින් පසු කාන්තා රාජ්‍ය නායිකාවන් දෙදෙනකු බිහි කිරීම පිළිබඳව අපි උදම් අනමින් සිටින්නෙමු. එහෙත් තවමත් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 5.8% කි. දේශපාලනයට සම්බන්ධ වූ බොහෝ කාන්තාවෝ සිය පියාගේ /සහෝදරයා ගේ හෝ ස්වාමියාගේ අභාවය නිසා හෝ ඔවුන්ගේ මග පෙන්වීම යටතේ දේශපාලනයට පැමිණියෝ වෙති. . මේ තුළින් ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා දේශපාලන නියෝජනය තුළ සිටින බහුතර කාන්තාවන්ගේ සමාජ පසුබිම පිළිබඳ සාකච්ඡා කරයි. (ලියනගේ සහ වළාකුළුගේ, 2006). නමුත් මෑත කාලීන නූතන පාර්ලිමේන්තුවල කාන්තා දේශපාලන නියෝජනයට දේශපාලන පවුල් පසුබිමේ හා ජනප්‍රියත්වයේ බලපෑම විස්තරාත්මක ව මෙහි දක්නට නොවීය.
මිහිරි ගුණවර්ධන විසින් රචිත කාන්තාවන් දේශපාලනයට එන්නේ පවුල් පසුබිම මත පමණක් ද? නැමති ලිපියෙහි , පාර්ලිමේන්තුව තුළ කාන්තා දේශපාලන නියෝජනයට දේශපාලන පවුල් පසුබිමේ හා ජනප්‍රියත්වයේ බලපෑම විස්තර කරයි. "දේශපාලන වේදිකාවෙ කාන්තාවෝ ලෙස දකින්න ලැබෙන්නේ දේශපාලනඥයන්ගේ බිරින්දෑවරු එසේ නැත්නම් නිළියෝ, දැඩි දේශපාලන පවුල් පසුබිමක් නැත්තම් වේදිකාවට නොව ඒ ඉස්සරහ තිබෙන පුටු පේළියේ ආසනයක්වත් කාන්තාවකට හිමි නොවේ. ශ්‍රී ලංකාවේ උගතුන්ගෙන් වැඩි කොටසක් ම කාන්තාවන්ය. එක්කෝ සමාජයේ ඒ අය ඉවතට තල්ලු කරනවා. නැත්නම් දේශපාලන පක්ෂවල පවතින පුරුෂාධිපත්‍ය සමඟ කාන්තාවන් ඉදිරියට ඒමට බියයි.". මේ තුළින් ලංකාවේ පාර්ලිමේන්තුව තුළ උගත් බුද්ධිමත් කාන්තාවන්ගේ සහභාගීත්වය අනිවාර්ය එකක් බව සාකච්ඡා කළ නමුත් කාලෝචිත විකල්ප විග්‍රහ වීම අවම ය.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතීමේ ගැටලුව නූතනයේ තීරණාත්මක සංධිස්ථානයක් බවට පත්ව තිබේ. 1931 සිට 2024 අභිනව පාර්ලිමේන්තුව දක්වා ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකය වන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය කිසිදු අවස්ථාවක සාධනීය මට්ටමක් කරා ළඟා නොවීම අතිශයින්ම තීරණාත්මක සාධකයකි . මේ සම්බන්ධව වර්තමානයේ බොහෝ අවධානයට ලක්ව තිබුණත් කෝටා ක්‍රමයක් හඳුන්වා දීමට අමතරව කාලෝචිත විකල්පයන් සෙවීම, විශේෂයෙන්ම 2024 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු යාවත්කාලීන දත්ත පදනම් කරගැනීම, කාන්තා නියෝජනය කෙරෙහි දේශපාලන පවුල් පසුබිමේ හා ජනප්‍රියත්වයේ බලපෑම කෙතෙක් දුරට වැදගත් දැයි 2010 සිට 2020 දක්වා පැවති පාර්ලිමේන්තු මැතිවරණ ආශ්‍රයෙන් ගැඹුරින් විමසා බැලීම යනාදිය සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීමට මෙමගින් බලාපොරොත්තු වූ බැවින් එම රික්තකය පිරවීම සඳහා මෙම අධ්‍යයනය කාලෝචිත වන බව පැහැදිලිය.

**අධ්‍යයන ක්‍රමවේදය**

**අධ්‍යයන ප්‍රදේශය**




රූපය 01: අධ්‍යයන ප්‍රදේශය

රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 400. 1 $km^2$ පැතිර පවතින අතර මෙයට ග්‍රාම නිලධාරි වසම් 40ක් අයත් වේ. පර්යේෂණ මාතෘකාව සඳහා යොදාගත් අධ්‍යයන ප්‍රදේශය වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මොරකැටිය ග්‍රාම නිලධාරී වසම ය. මෙම වසම වර්ග කිලෝමීටර් තුනක් ව්‍යාප්තව පවතින අතර පවුල් 1338 ක් පමණ ජීවත් වේ. ඒ අනුව ලාංකේය පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය පසුගාමී තත්ත්වයක පවතින්නේ ඇයි ද යන්න කරනු ලබන මෙම පර්යේෂණයට අදාළ නිගමනය සොයා ගැනීම මෙම ප්‍රදේශය ආශ්‍රයෙන් අධ්‍යයනය කරයි.

**නියැදිය**

මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා උපයෝගී කරගන්නා නියැදිය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වේ. ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කය ඇඹිලිපිටිය ප්‍රා.ලේ කොට්ඨාශයේ කොලොන්න ආසනයට අයත් මොරකැටිය ග්‍රාම නිලධාරී වසම තුළ 3352 ක් පමණ ඡන්දදායකයන් සිටින අතර, එයින් පිරිමි පාර්ශ්වයෙන් 20 දෙනකු හා කාන්තා පාර්ශවයෙන් 30දෙනෙකු සහිතව දත්ත දායකයන් 50දෙනකු නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. එමෙන්ම පළාත් පාලන ආයතනවල මන්ත්‍රී තිදෙනෙකුගේ සම්මුඛ සාකච්ඡා ද මේ සඳහා යොදා ගන්නා ලදි.

**දත්ත එක් රැස්කිරීම**

**ප්‍රාථමික මූලාශ්‍රය භාවිතය**

නියැදියට අනුව තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නමාලා සහ සම්මුඛ සාකාච්ඡා යන සමාජ විද්‍යාත්මක ක්‍රමවේද භාවිතා කරන ලදී. මෙහිදි විවෘත ප්‍රශ්න මාලාවක් සකස් කර එය පිරිමි පාර්ශ්වයෙන් 20 දෙනකු හා කාන්තා පාර්ශවයෙන් 30දෙනෙකු සහිතව 50 ක් වූ දත්ත දායකයන් හරහා තොරතුරු ලබාගැනීම සිදු වූ අතර තවදුරටත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් පළාත් පාලන ආයතනවල මන්ත්‍රී තිදෙනෙකුගෙන් තොරතුරු ලබාගන්නා ලදී. තොරතුරු ලබාගැනීම සිදු වූ අතර තවදුරටත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ද ඔවුන්ගෙන් තොරතුරු ලබාගන්නා ලදී.

**ද්විතික මූලාශ්‍රය භාවිතය**

දත්ත එක්රැස් කිරීමේදී පසුගිය මැතිවරණයන්හි ප්‍රතිඵල වාර්තා, ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා සහ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන ආදී රාජකාරීමය ලේඛන අධ්‍යයනය කිරීම සිදු විය. එමෙන්ම මැතිවරණ, ස්ත්‍රී නියෝජනය ,පක්ෂ ක්‍රමය සහ ඡන්දදායක චර්යාව ආදිය පිළිගත් ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල ලිපි සහ පුවත්පත් ලිපි ආදී ද්විතික මූලාශ්‍ර භාවිතා කරමින් පර්යේෂණයට අදාළ තොරතුරු ලබාගන්නා ලදී.

**දත්ත විශ්ලේෂණය කිරීම**

**ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය**

පර්යේෂණයට අදාළ ව ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේදී ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් භාවිතා කරනු ලැබීය. එහිදි දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාලේඛන විධික්‍රමය යටතේ MS Excel මෘදුකාංගය භාවිතා කළ අතර සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම ශිල්ප එනම් සංඛ්‍යා, ප්‍රතිශත, දත්ත වගු සහ ප්‍රස්ථාර සටහන් භාවිතා කරමින් විශ්ලේෂිත දත්ත නිරූපණය කරන ලදී.

**ගුණාත්මක දත්ත විශ්ලේෂණය**

ගුණාත්මක දත්ත විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක වශයෙන් විග්‍රහ කළ නොහැකි දත්තයන් ගුණාත්මක ප්‍රවේශය යටතේ විග්‍රහ කිරීමටත්, රැස් කරගනු ලැබූ දත්ත තුළ ගැබ්වී ඇති ගුණාත්මක අගයන් ඉස්මතු කිරීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණය කිරීමත් සිදු කරනු ලැබීය.

**සාකච්ඡාව සහ විශ්ලේෂණය**

ශ්‍රී ලංකාවේ කාන්තාව දේශපාලනයට සම්බන්ධ වීම 1931 සර්වජන ඡන්ද බලය ලැබීමත් සමගම කාන්තාව ඡන්ද බලය හිමිකරගත්හ (කාන්තා දේශපාලන දැනුම හා සහභාගීත්වය වර්ධනය කිරීම, පුහුණු අත් පොත) .ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබා දුන්නේ අවුරුදු 30ට වැඩි ස්ත්‍රීන්ට පමණක් ඡන්ද බලය හිමිය යන කොන්දේසිය ගෙන එමින් ය. නමුත් මෙයට විරුද්ධව අවුරුදු 21ට වැඩ සියලුම ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබා දිය යුතුය කියමින් ගෙන ගිය සටන් ව්‍යාපාර වල ප්‍රතිඵලයක් ලෙස ඩොනමෝර් කොමිසමට අවුරුදු 21 ට වැඩි සියලුම දෙනාට ඡන්ද අයිතිය ලබාදීම සඳහා සංශෝධනයක් ගෙන ඒමට සිදුවිය (මඩහපොළ , 2004;14). 1931 නොවැම්බර් මස 14 දින පැවති මැතිවරණයට රුවන්වැල්ල ආසනය නියෝජනය කරමින් ඇඩ්ලින් මොලමුරේ මහත්මිය තරඟ කරමින් ජයග්‍රහණය කළ අතර ඇය රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ ප්‍රථම ස්ත්‍රිය වීමේ අවස්ථාව උදාකරගෙන තිබේ. රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමයෙන් අනතුරුව 1948 දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට කාන්තාවෝ තිදෙනෙක් තරග වැදුණහ.

ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් පසුව ප්‍රථම මහ මැතිවරණය පැවැත්වූයේ 1952 වසරේ දී ය. 1952 පැවති මෙම පාර්ලිමේන්තු මැතිවරණයට නියෝජිතයින් 95ක් තේරී පත් වී ඇති අතර ඉන් ස්ත්‍රී නියෝජනය වූයේ දෙදෙනෙකි. 1956 පැවැති පාර්ලිමේන්තුවේ 95ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් හතර දෙනෙක් නියෝජනය කළහ. එය 4.2% ක් වූ අතර 4% පසුගිය පාර්ලිමේන්තුවට වඩා 2.1% ක ඉහළ යාමක් පෙන්නුම් කරයි.. 1960 මාර්තු මස පැවති පාර්ලිමේන්තුවේ 151ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් නියෝජනය වූයේ තිදෙනෙක් පමණි. 1960 ජූලි 1961, 1965, 1970, 1977 සිට වර්තමානය දක්වා කාලසීමාව වන තෙක් ස්ත්‍රී නියෝජනය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකයි. 1965 හයවන පාර්ලිමේන්තුවෙ 151 ක් වූ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් නවක අපේක්ෂකයන් බොහෝ දෙනෙක් ඉදිරිපත් වුවත් ස්ත්‍රීන්ගේ නියෝජනය වූයේ හයක් පමණි (මඩහපොළ , 2004;21). එහි බණ්ඩාරනායක මහත්මිය වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ගෙන විපක්ෂ නායිකාව බවට පත් වීම විශේෂ දෙයක් වන අතර උප ඇමතිවරයන් දෙදෙනෙක් ද පත්විය. මෙහිදී 5ස් වන පාර්ලිමේන්තුවට වඩා ස්ත්‍රීන් තුන්දෙනෙක් වැඩිවීම නිසා ප්‍රතිශතය 2%ක් දක්වා වැඩි විය. 1970 හත්වන පාර්ලිමේන්තුවෙ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ඇතුළු ස්ත්‍රීන් හතක් නියෝජනය විය. 1977 පැවති 8 වන පාර්ලිමේන්තුවේ 168ක් වූ මුළු මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් 11 ක් නියෝජනය කෙරුණි. (මඩහපොළ , 2004;25).

1989 පැවති පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන ලද්දේ නව ඡන්ද ක්‍රමයක් වන සමානුපාතික ඡන්ද ක්‍රමයක් තුළය. 1977දී මැතිවරණයේ 168 ක් වූ මුළු පාර්ලිමේන්තු නියෝජනය මෙම මැතිවරණයේදී 225 ක් දක්වා වැඩි කරන ලදී. ඒ තුළ ස්ත්‍රී නියෝජනය 13 ක් වූ අතර එය 5. 4% ක් විය. එය 8වන පාර්ලිමේන්තුව සමඟ සසඳන විට 0.8 කින් අඩුවී ඇත. අවුරුදු හතක් ප්‍රජා අයිතිය අහිමි ව සිටි සිරිමාවෝ බණ්ඩාරනායක නැවත දේශපාලනයට පිවිසෙන්නේ මෙම මැතිවරණයේදී ය.225 ක් වූ මුළු මන්ත්‍රී මණ්ඩලය සිරිමාවෝ බණ්ඩාරනායක සහ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඇතුළු ස්ත්‍රීන් 12කගෙන් සමන්විත විය. මෙම පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය සම්බන්ධව සාකච්ඡා කිරීමේදී වැදගත් කරුණු කිහිපයක්ම දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ පළමු අග්‍රාමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ කණිටු දියණිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය දෙවන අග්‍රාමාත්‍ය ලෙස තේරී පත්වීමය. මෙම කාල සීමාව තුළ ඇය ප්‍රථම ජනාධිපතිනිය වශයෙන් ග්‍රහණය කිරීම ද ශ්‍රී ලාංකේය දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ ස්ථානයකි.


2000 පැවති එකොළොස් වන පාර්ලිමේන්තුව තුළ 225ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රී නියෝජනය වූයේ 9ක් පමණකි. එය 4%ක් වන අතර 1994 පාර්ලිමේන්තුවට වඩා 1.3% ක් අඩුවීමක් පෙන්නුම් කරයි (මඩහපොළ, 2004;26). 2001 දී 12ස්වන පාර්ලිමේන්තු මැතිවරණයේ දී ස්ත්‍රීන් 10ක් තේරී පත් වූ අතර ඒ අතර නවක මන්ත්‍රීවරියන් වශයෙන් මාතරින් මල්ලිකා ද මැල්, මහනුවරින් චිත්‍රා ශ්‍රීමනි මන්තිලක, පුත්තලමෙන් මේරි ලැරිස් පෙරේරා යන අය තේරීපත්විය. එයින් දේශපාලන පසුබිමක් නොමැතිව පැමිණි එකම මන්ත්‍රීවරිය වූයේ චිත්‍රා මන්තිලක යි (මඩහපොළ , 2004;26). 2004 එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ පිහිට වූ 13වන පාර්ලිමේන්තුවේ 225 ක් වූ මන්ත්‍රි මණ්ඩලයේ ස්ත්‍රීන් 11 ක් විය. ජාතික ලැයිස්තුවෙන් නම් කළ මේරි ලුසිඩා පත් කිරීමෙන් පසුව නියෝජනය 12ක් විය.(මඩහපොළ, 2004;27). 2010 වර්ෂයේ දී මෙන්ම 2015 වසරේ පැවැත්වුණු මැතිවරණවල දී පාර්ලිමේන්තුවේ 225 ක මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන්ගේ නියෝජනය දක්නට ලැබෙන්නේ නියෝජිතවරියන් 13ක් පමණි. 2020 වසරේ පාර්ලිමේන්තුවේ ස්ත්‍රීන්ගේ නියෝජනය දක්නට ලැබෙන්නේ නියෝජිතවරියන් 12ක් පමණි. 2024 වසරේඑය නියෝජිතවරියන් 22ක් විය.

මේ අනුව පෙනී යන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව පළමු පාර්ලිමේන්තුවේ සිට 9 වන පාර්ලිමේන්තුව දක්වාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් වශයෙන් තේරී පත්ව ඇත්තේ අවම මට්ටමක බවයි. ශ්‍රී ලංකා දේශපාලන රංග භූමිය තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවීම් ඉතා සිත්ගන්නාසුලු විවාදයට බඳුන් වී ඇති නමුත් ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය 51%තරම් ඉහළ මට්ටමක තිබියදීත් ජාතික ව්‍යවස්ථාදායකය තුළ කාන්තා නියෝජනය 10%ක් තරම් අඩුවෙන් පැවතීම ප්‍රබල ගැටලුවක් බවට පත්වී තිබේ.

වගුව 1: ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු තුළ ස්ත්‍රී නියෝජනය

| මැතිවරණ වර්ෂය | මුළු මන්ත්‍රී සංඛ්‍යාව | මන්ත්‍රීවරියන් සංඛ්‍යාව | මන්ත්‍රීවරියන්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|
| 1947 | 101 | 3 | 3 . 0% |
| 1952 | 101 | 2 | 2 . 0% |
| 1956 | 101 | 4 | 4 . 0% |
| 1960 (මාර්තු) | 157 | 3 | 1 . 9% |
| 1960 (ජූලි) | 157 | 3 | 1 . 9% |
| 1965 | 157 | 6 | 3 . 8% |
| 1970 | 157 | 6 | 3 . 8% |
| 1977 | 168 | 11 | 6 . 5% |
| 1989 | 225 | 13 | 5 . 8% |
| 1994 | 225 | 12 | 5 . 3% |
| 2000 | 225 | 9 | 4 . 0% |
| 2001 | 225 | 10 | 4 . 4% |
| 2004 | 225 | 13 | 5 . 8% |
| 2010 | 225 | 13 | 5 . 8% |
| 2015 | 225 | 13 | 5 . 8% |
| 2020 | 225 | 12 | 5 . 3% |
| 2024 | 225 | 22 | 9. 8% |

මූලය: කොළඹ මැතිවරණ මහලේකම් කාර්යාලය, 2025




මූලය: කොළඹ මැතිවරණ මහලේකම් කාර්යාලය, 2025

රූපය 02: 1947 සිට 2025 දක්වා ජාතික ව්‍යවස්ථාදායකය තුළ කාන්තා නියෝජනය

ලාංකේය මැතිවරණ ක්‍රමය ස්ත්‍රී නියෝජිතයන්ට බලපෑම් කරන ආකාර කිහිපයක් හඳුනා ගත හැකිය. ඉන් එකක් නම් නියෝජනය කෙරෙහි දේශපාලන පවුල් පසුබිමේ හා ජනප්‍රියත්වයේ බලපෑමයි.

නූතන ලාංකේය පාර්ලිමේන්තුව තුළ (කාන්තා නියෝජනය කෙරෙහි දේශපාලන පවුල් පසුබිමේ හා ජනප්‍රියත්වයේ බලපෑම. (2010, 2015, 2020 පාර්ලිමේන්තු තුළ ස්ත්‍රී නියෝජනය ඇසුරින්)

වගුව 2: 2010 - 2015 හත්වැනි පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය

| | නම | දිස්ත්‍රික්කය | නියෝජනය ලබා ගත් ආකාරය |
|---|---|---|---|
| 1 | සුමේධා ජී ජයසේන | මොනරාගල | ස්වාමියා ඝාතනය |
| 2 | පවිත්‍රාදේවි වන්නිආරච්චි | රත්නපුර | පිය උරුමයෙන් |
| 3 | නිරූපමා රාජපක්ෂ | හම්බන්තොට | පවුල් පසුබිමෙන් |
| 4 | චන්ද්‍රානි බණ්ඩාර | අනුරාධපුර | පිය උරුමයෙන් |
| 5 | තලතා අතුකෝරල | රත්නපුර | සහෝදරයාගේ අභාවයෙන් පසු |
| 6 | සුදර්ශණී ප්‍රනාන්දුපුල්ලේ | ගම්පහ | ස්වාමියා ඝාතනය |
| 7 | ශ්‍රියානි විජේවික්‍රම | දිගාමඩුල්ල | පළාත් සභා මට්ටමින් දේශපාලනයේ නිරත වීම |
| 8 | රෝසි සේනානායක | කොළඹ | නිළිය විවාහක ,රූ රැජින |
| 9 | උපේක්ෂා ස්වර්ණමාලි | ගම්පහ | නිළිය |
| 10 | විජයකලා මහේෂ්වරන් | යාපනය | ස්වාමියා ඝාතනය |
| 11 | මාලනී ෆොන්සේකා | ජාතික ලැයිස්තුව | නිළිය |
| 12 | කමලා රණතුංග | ජාතික ලැයිස්තුව | ප්‍රාදේශීය මට්ටමින් දේශපාලනයේ නියුතු වීම |
| 13 | අනෝමා ගමගේ | ජාතික ලැයිස්තුව | ස්වාමියා සක්‍රීයව දේශපාලනය නිරතවීම |

මූලය: http://www.parliament.lk

වගුව 3: 2015 - 2020 අටවන පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය

| | නම | දිස්ත්‍රික්කය | නියෝජනය ලබා ගත් ආකාරය |
|---|---|---|---|
| 1 | චන්ද්‍රානි බණ්ඩාර | අනුරාධපුර | පිය උරුමයෙන් |
| 2 | තලතා අතුකෝරල | රත්නපුර | සහෝදරයාගේ අභාවයෙන් පසු |
| 3 | විජයකලා මහේෂ්වරන් | යාපනය | ස්වාමියා ඝාතනය |
| 4 | සුදර්ශණී ප්‍රනාන්දුපුල්ලේ | ගම්පහ | ස්වාමියා ඝාතනය |
| 5 | සුමේධා ජී ජයසේන | මොනරාගල | ස්වාමියා ඝාතනය |
| 6 | අනෝමා ගමගේ | ජාතික ලැයිස්තුව | ස්වාමියා සක්‍රීයව දේශපාලනය නිරතවීම |
| 7 | පවිත්‍රාදේවි වන්නිආරච්චි | රත්නපුර | පිය උරුමයෙන් |
| 8 | ශ්‍රියානි විජේවික්‍රම | දිගාමඩුල්ල | පළාත් සභා මට්ටමින් දේශපාලනයේ නිරත වීම |
| 9 | ගීතා සමන්මලී | ගාල්ල | නිළිය |
| 10 | හිරුණිකා ප්‍රේමචන්ද්‍ර | කොළඹ | පියාගේ ඝාතනය |
| 11 | තුසිතා විජේමාන්න | කෑගල්ල | පළාත් සභා මට්ටමින් දේශපාලනයේ නිරත වීම |
| 12 | රෝහිණී කුමාරි | මාතලේ | සැමියාගේ අභාවයෙන් |
| 13 | ශාන්ති ශ්‍රී ස්කන්ධරාජා | ජාතික ලැයිස්තුව | පළාත් සභා මට්ටමින් දේශපාලනයේ නිරත වීම |

මූලය: http://www.parliament.lk

වගුව 4: 2020 නවවන පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය

| | නම | දිස්ත්‍රික්කය | නියෝජනය ලබා ගත් ආකාරය |
|---|---|---|---|
| 1 | පවිත්‍රාදේවි වන්නිආරච්චි | රත්නපුර | හිටපු ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙකු වූ ධර්මදාස වන්නිආරච්චිගේ දියණිය |
| 2 | සුදර්ශණී ප්‍රනාන්දුපුල්ලේ | ගම්පහ | හිටපු අමාත්‍ය ප්‍රනාන්දුපුල්ලේ ගේ බිරිඳ |
| 3 | තලතා අතුකෝරල | රත්නපුර | හිටපු නියෝජ්‍ය නායක ගාමිණී අතුකෝරලගේ නැගණිය |
| 4 | රෝහිණී කුමාරි | මාතලේ | පාර්ලිමේන්තු මන්ත්‍රී විජයරත්න බණ්ඩාරගේ දියණිය සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව කවිරත්න ගේ බිරිඳ |
| 5 | ගීතා සමන්මලී | ගාල්ල | නිළිය |
| 6 | කෝකිලා ගුණවර්ධන | ගම්පහ | හිටපු පළාත් සභා මන්ත්‍රී නාමල් ගුණවර්ධනගේ නැගණිය |
| 7 | මුදිතා ප්‍රශාන්ති | රත්නපුර | පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් ද සොයිසා ගේ බිරිඳ |
| 8 | ඩයනා ගමගේ | ජාතික ලැයිස්තුව | පියා වන දයා ගමගේ සක්‍රීයව දේශපාලනයේ නිරතවීම. |
| 9 | හරිනි අමරසූරිය | ජාතික ලැයිස්තුව | |
| 10 | මංජුලා දිසානායක | ජාතික ලැයිස්තුව | හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සාලින්ද දිසානායක ගේ බිරිඳ සැමියාගේ අභාවයෙන් පසු |
| 11 | සීතා අරඹේපොළ | ජාතික ලැයිස්තුව | |
| 12 | රාජිකා වික්‍රමසිංහ | කෑගල්ල | සබරගමු පළාත් සභා හිටපු අමාත්‍ය ශ්‍රී ලාල් වික්‍රමසිංහගේ බිරිඳ |

මූලය: http://www.parliament.lk

1931 සිට 2020 දක්වා ම වසර 80ක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලනයට මෙතෙක් පැමිණි ස්ත්‍රීන්ගේ නියෝජනය සම්බන්ධයෙන් පෙනී යන වැදගත්ම කාරණය වන්නේ නියෝජිතවරියන්ගෙන් 80%ට වඩා ප්‍රමාණයක් දේශපාලනයට පිවිස ඇත්තේ පක්ෂ නායකත්වය මත සමඟ පැවැති හිතවත්කමක් මත, එසේ නොමැතිනම් ක්‍රියාකාරී දේශපාලන පවුල් පසුබිමක් මත, එසේ නොමැති නම් එම පවුල්වල පියා /සැමියා/ සහෝදරයා නැතිනම් ඥාතියකුගේ අභාවයෙන් පසුව හෝ ඝාතනයෙන් පසුව නැතහොත් නාමයෝජනා ප්‍රතික්ෂේප වූ අවස්ථාවකදී ය. මෙම තත්වය වර්තමාන 2024 පාර්ලිමේන්තුවන

විට තරමක් අඩු වී තිබේ. කුමාරි ජයවර්ධන දක්වන පරිදි "වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනතාව ඡන්දය ලබා දෙනුයේ ප්‍රසිද්ධිය මත පදනම් වී, රූප සුන්දරියන් ,නිළියන් යන නිර්ණායකයන් පදනම් කරගෙන වන අතර ඔවුන්ට සැබෑ ලෙස දේශපාලනය පිළිබඳ විඥාණයත් තිබේද යන්න ගැටලුකාරී ප්‍රශ්නයකි.

මෑතකාලීන ව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය පසුගාමී තත්ත්වයක පවතින්නේ ඇයි ද යන්න බලපාන සාධක පිළිබඳ පර්යේෂණය දත්තදායකයින් 50 ක් යොදාගනිමින් සිදු කළ අතර ඔවුන්ගේ අදහස් පහත ආකාරයට විමසා බැලිම සිදු විය. දත්ත දායකයින් 50ක් වූ පිරිස අතුරින් පුම්තිරිභාවය පදනම් කර ගනිමින් ස්ත්‍රී පාර්ශවයෙන් 30ක් ද පුරුෂ පාර්ශවයෙන් 20ක් ද පර්යේෂණය සඳහා යොදා ගැණුනි. එය ප්‍රතිශතයක් ලෙස ස්ත්‍රී පාර්ශවය 60%ක් වූ අතර පුරුෂ පාර්ශවය 40%ක් විය. දත්තදායකයින් පනස්දෙනා අතුරින් වයස අවුරුදු 18ත් - 25ත් අතර පසුවන කුළුඳුල් ඡන්දදායකයින් 20ක් විය. වයස අවුරුදු 25ත් - 35ත් අතර දත්තදායකයින් 10 ක් වූ අතර වයස අවුරුදු 35ත් - 50ත් අතර දත්තදායකයින් 12 දෙනෙකු විය. එමෙන්ම වයස අවුරුදු 50ට වැඩි දත්තදායකයින් 08 දෙනෙක් ද විය. ඒ අනුව මෙහි දත්ත දායකයාගේ වයස පිළිබඳ විශ්ලේෂණයේ දී දත්ත දායකයන්ගෙන් 60% ක් ම තරුණ ප්‍රජාව නියෝජනය කරන බව පෙනී යයි.

මෙම දත්තදායකයිනගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ සලකා බැලූ විට පාසල් නොගිය දත්ත දායකයින් 5ක් ද , පාසල් මට්ටමේ අධ්‍යාපනය ලැබූ දත්ත දායකයින් 15ක් ද, පාසල් අධ්‍යාපන මට්ටමෙන් පසු උසස් අධ්‍යාපනය ලැබූ (ඩිප්ලෝමාධාරී) දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 10 ක් ද , විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබූ දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 18 ක් ද, වෙනත් (MA/ PhD) දායකයින්ගේ සංඛ්‍යාව 2 ක් ද සමීක්ෂණ දත්ත අනුව නිගමනයට බඳුන් විය. ඒ අනුව දත්ත දායකයින්ගෙන් බහුතරයක් හොඳ අධ්‍යාපන මට්ටමක් සහිත, උගත් ප්‍රජාවගෙන් සමන්විත වීම හා නියදිය තුළ උගත්, සාමාන්‍යය මට්ටමින් උගත්, නූගත් යන සෑම අධ්‍යාපන කොටසක්ම සමන්විත වීම හරහා මෙම අධ්‍යයනය සාර්ථකව සිදුකර ගැනීමට එය පිටවුහලක් වේ.

මෙම දත්තදායකයිනගේ සක්‍රීය ඡන්දදායකත්වය පිළිබඳ සලකා බැලූ විට සමීක්ෂණ දත්තයන්ට අනුව දත්ත දායකයන්ගෙන් ලබාගත් තොරතුරු මත පදනම්ව දත්ත විශ්ලේෂණය කිරීමේ දී පෙනී යනු කාරණයක් වන්නේ, නියැදිය 50කින් සක්‍රීය ඡන්දදායකයන්ගේ ප්‍රතිශතය 75% ක් ද ,සක්‍රීය ඡන්දදායකයන් නොවන 25% ක් ද ලෙස නිගමනයට බඳුන් වීම ය. මේ අනුව සමීක්ෂණයේ දී තොරතුරු ලබා ගත් දත්ත දායකයන්ගෙන් 75% ක් ම ලාංකික මැතිවරණ ක්‍රියාවලිය තුළ සක්‍රිය ඡන්දදායකයන් වූ බැවින් සාර්ථක නිගමනයන් හා විසඳුම් ලබා ගැනීම අපේක්ෂා කළ හැකිය.

අධ්‍යයනයන්ට සහභාගි වූ දත්ත දායකයන්ගේ රැකියාවේ ස්වභාවය පිළිබඳ විශ්ලේෂණයේ දී මෙලෙස දැක්විය හැක. සමීක්ෂණ දත්ත අනුව දත්ත දායකයන්ගේ ලබාගත් තොරතුරු අනුව රැකියාවේ ස්වභාවය පිළිබඳ විමසීමේ දී නියැදියට අනුව රාජ්‍ය අංශයේ දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 15 ක් ද, අර්ධ රාජ්‍ය අංශයේ දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 7 ක් ද, පෞද්ගලික අංශයේ නියුතු දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 9 ක් ද, ස්වයං රැකියාවල නියුතු දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 5 ක් ද, විශ්‍රාමික පිරිස් නියෝජනය කරන දත්ත දායකයන්ගේ සංඛ්‍යාව 4 ක් ද, රැකියා විරහිත( රැකියා අපේක්ෂාවෙන් සිටින උපාධිධාරීන්) දත්ත දායකයින්ගේ සංඛ්‍යාව 6 ක් ද , වෙනත් ( උසස් අධ්‍යාපනය/ විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ නියුතු සිසුන්) 4 ක් ද වේ. මෙහිදී නියැදියේ ඉහළ ප්‍රතිශතයක් නියෝජනය වනුයේ රාජ්‍ය අංශයේ නියුතු අයගෙනි. මේ ආකාරයට රැකියාවේ ස්වභාවය සමීක්ෂණ දත්ත අනුව නිගමනයට බඳුන් විය.

සමස්තයක් වශයෙන් දත්ත දායකයින් 35 දෙනාගේ මූලික තොරතුරු පහත වගුවෙ හි දක්වා තිබේ.

වගුව 5: ප්‍රතිචාරකයාගේ මූලික තොරතුරු

| වයස | | | | ස්ත්‍රී/පුරුෂ | | අධ්‍යාපනය | | | | | රැකියාව | | | | | | ඡන්දදායකත්වය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අවුරුදු 18ත් - 25ත් අතර | අවුරුදු 25ත් - 35ත් අතර | අවුරුදු 35ත් -50ත් අතර | අවුරුදු 50ට වැඩි | ස්ත්‍රී | පුරුෂ | පාසල් මට්ටමේ | උසස් අධ්‍යාපනය | විශ්ව විද්‍යාල අධ්‍යාපනය | වෙනත් (MA/ Phd) | පාසල් නොගිය | රාජ්‍ය | අර්ධ රාජ්‍ය අංශයේ | පෞද්ගලික | ස්වයං රැකියා | රැකියා විරහිත | වෙනත් | සක්‍රිය ඡන්දදායකයන් | සක්‍රිය ඡන්දදායකයන් නොවන |
| 20 | 10 | 12 | 08 | 30 | 20 | 15 | 10 | 18 | 02 | 05 | 15 | 07 | 09 | 05 | 06 | 02 | 37 | 13 |

මූලය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

සමීක්ෂණ දත්ත අනුව පදනම්ව ලබාගත් තොරතුරු මත බැලූ කල පෙනීයන කාරණයක් වන්නේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතීම සම්බන්ධ ව මූලික දැනුම දත්තදායකයින්ට පවතින බවත්, එය සාධනීය මට්ටමක පවතින බවත් ය. මෙහිදී දත්ත දායකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය අවම මට්ටමක පැවතීම පිළිබඳව දැනුවත් නමුත් පළාත් සභා හා ප්‍රාදේශීය සභා යන දේශපාලන ආයතන වල කාන්තා නියෝජනය අවම මට්ටමක පැවතීම පිළිබඳව දැනුවත්භාවය පාර්ලිමේන්තුවේ දැනුවත්භාවය ට සාපේක්ෂව අඩු බව ද අනාවරණය විය. කෙසේ නමුත් මෙම දත්ත දායකයන්ගෙන් 75% ක් ම පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය පිළිබඳව සෑහීමකට පත් නොවන ආකාරය නිගමනයට බඳුන් විය.

අධ්‍යයනයන්ට සහභාගි වූ දත්ත දායකයන්ගෙන් පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය වර්ධනය කිරීම කළ යුත්තේ ඇයි ? පිළිබඳ විශ්ලේෂණයේ දී විවිධාකාර ප්‍රතිචාර ලැබුණි. මෙලෙස දැක්විය හැක. එහිදී බහුතර මතය වූයේ ,ශ්‍රී ලංකාවේ කාන්තාව සාක්ෂරතා මට්ටමින් ඉදිරියෙන් පසු වීම හේතුවෙන් රටේ සෑම ක්ෂේත්‍රයකම සංවර්ධන සඳහා සහාය ලබා ගැනීමයි. ප්‍රතිශතයක් වශයෙන් 25% ක් නියැදියෙන් මෙම මතය ඉදිරිපත් කර තිබේ. පුරුෂ පක්ෂය අවධානය නොදක්වන කාන්තාව, ළමා ආරක්ෂණය වැනි ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීම, රටක දියුණු දේශපාලන සංස්කෘතියක් ඇති වීමට නම් පුරුෂ පක්ෂයට සාපේක්ෂව එම රටේ ව්‍යවස්ථාදායකය තුළ කාන්තා පක්ෂයට ද සාධනීය නියෝජනයක් අත්‍යවශ්‍ය වීම යන සාදක මත ද කාන්තා නියෝජනය වර්ධනය කිරීම කළ යුතු බවට අනෙකුත් දත්ත දායකයන්ගේ අදහස් අතර විය.

අධ්‍යයනයන්ට සහභාගි වූ දත්ත දායකයන්ගෙන් පාර්ලිමේන්තු තුළ ස්ත්‍රී නියෝජනය අවම වීමට වැඩිම බලපෑමක් ඇති කළ සාධක පිළිබඳ විශ්ලේෂණයේ දී, වඩාත්ම බලපෑමක් ඇති කරන හේතු සාධකය ලෙස දේශපාලන පවුල් පසුබිමකින් තොරව ස්වාධීනව දේශපාලන කරළියට පැමිණීමේ අපහසුතාවය ඉදිරිපත් කර තිබේ . දේශපාලන පවුල් පසුබිම නියෝජනය ලබා ගැනීමේ දී පහසුම ක්‍රමය වන අතර දේශපාලනික සවිඥානය/ අත්දැකීම් /අධ්‍යාපන සුදුසුකම් පාර්ලිමේන්තු නියෝජනය ලබා ගැනීමේ දී එතරම් වැදගත් නොවීය. 50 ක් වූ නියදියෙන් 38ක් ම දත්ත දායකයන් පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය අවම වීමට වඩාත් බලපෑමක් ඇති කරන සාධකය ලෙස දේශපාලන පවුල් පසුබිමකින් තොරව ස්වාධීනව දේශපාලන කරළියට පැමිණීමේ අපහසුතාවය ඉදිරිපත් කර තිබේ. වෙනත් යටතේ ඉදිරිපත් වූ සාධක වූ අතර, දේශපාලන පක්ෂ පුරුෂ මූලික වීම, කාන්තාවක් තවත් කාන්තාවක් ඉදිරියට ගෙන ඒමට තිබෙන අකමැත්ත, ආර්ථික දුෂ්කරතා, ස්ත්‍රිය පිළිබඳව ලාංකේය සමාජ සංස්කෘතිය දක්වන ආකල්පය, රංගන ශිල්පිනියන් පාර්ලිමේන්තුව තුළ මීට පෙර ජනතාව තුළ අප්‍රසාදයක් ඇති වන ආකාරයට ක්‍රියා කිරීම මත සමස්ත කාන්තා නියෝජනයම හෑල්ලුවට ලක්වීම, පවතින මැතිවරණ ක්‍රමය, දේශපාලන ප්‍රචණ්ඩත්වය යනාදිය ඉදිරිපත් විය. කෙසේ නමුත් මෙම තත්වය වර්තමාන 2024 පාර්ලිමේන්තුවන විට තරමක් අඩු වූ නමුත් 1931 සිට 2020 දක්වා ම වසර 80ක පමණ කාලය තුළ ශ්‍රී

ලංකාවේ ජාතික දේශපාලනයට මෙතෙක් පැමිණි ස්ත්‍රීන්ගේ නියෝජනය සම්බන්ධයෙන් පෙනී යන වැදගත්ම සාධකය වන්නේ දේශපාලන පවුල් පසුබිමකින් තොරව ස්වාධීනව දේශපාලන කරළියට පැමිණීමේ අපහසුතාවය බව දත්ත දායකයන්ගෙ අදහසයි.

අධ්‍යයනයන්ට සහභාගි වූ දත්ත දායකයන්ගෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ කාන්තා නියෝජිතවරියන් හරහා රටට සිදු වූ සේවය පිළිබඳ විශ්ලේෂණයේ දී කිරීමේ දී ,දත්ත දායකයින්ගෙන් ලැබුණු ප්‍රතිචාරය සුබවාදී නැත. දත්ත දායකයන්ගෙන් 38 ක් ම ඔවුන්ගෙන් රටට සිදු වූ සේවය අසතුටුදායක බව මතය විය. කෙසේ නමුත් මෙම සමීක්ෂණ දත්ත වලට අනුව පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජිතවරියන්ගෙන් රටට සිදු වූ සේවය පිළිබඳ ප්‍රශංසනීය ඇගැයීමක් කිසිදු දත්ත දායකයෙක් හරහා සිදු නොවීය. ඒ අනුව පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජිතවරියන් හරහා රටට සිදු වූ සේවය සම්බන්ධව මෙම නියැදියේ දත්ත දායකයන්ගේ අදහස් අනුව අප්‍රසාදයක් පවතින ආකාරය හඳුනාගත හැකිය.

එමෙන්ම , පාර්ලිමේන්තු හරහා තේරී පත් වූ ස්ත්‍රී නියෝජිතවරියන්ගේ දේශපාලන සවිඥානය හා දැනුම පිළිබඳ තෘප්තිමත්භාවය විශ්ලේෂණයේ දී ද දත්ත දායකයින්ගෙන් ලැබුණු ප්‍රතිචාරය අසතුටුදායකය. සමීක්ෂණ දත්ත අනුව, පාර්ලිමේන්තුවට තේරී පත්වූ නියෝජිතවරියන්ගෙන් දේශපාලන සවිඥානය හා දැනුම සම්බන්ධයෙන් නියැදියෙන් 31දෙනෙකු අතෘප්තිමත් ය. වෘත්තිය මට්ටමෙන් හෝ අධ්‍යාපන සුදුසුකම්වලින් ඔවුන් පාර්ලිමේන්තු නියෝජනයට සුදුසුකම් ලැබුව ද, දේශපාලන සවිඥානය හා දැනුම අත්දැකීම් පළපුරුද්ද හා යන සාධක ඔස්සේ බැලූ විට ඔවුන්ගේ දේශපාලන සවිඥානය ඉතාමත් අවම මට්ටමක පවතින බව දත්ත දායකයන්ගේ අදහසයි.

මීට අමතරව පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන ස්ත්‍රී අපේක්ෂකයන් පරාජය වීමට බලපාන සාධක කිහිපයක් ද මෙම පර්යේෂණය හරහා අනාවරණය විය. ස්ත්‍රී අපේක්ෂකයන් කෙරෙහි ඡන්ද දායකයන්ගේ විශ්වාසයක් නොමැති වීම යන සාධකය මේ සඳහා ප්‍රබලම සාධකය බව 50 ක් වූ නියැදියෙන් 25කගේ ම මතය විය. ඊට අමතරව නියැදියෙන් ඉතිරි 25 දෙනා හරහා කාන්තා අපේක්ෂකයන් හරහා රටට සැලකිය යුතු සේවයක් මීට පෙර සිදු නොවීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු පුරුෂ පක්ෂයට සාපේක්ෂව සංවිධානාත්මක අයුරින් ඉටු කිරීමට නොහැකි වීම, දේශපාලන පක්ෂ තුළින් ස්ත්‍රී අපේක්ෂකයන් සඳහා ලැබෙන සහය අවම වීම, ස්ත්‍රීන් සඳහා කෝටා ක්‍රමයක් හඳුන්වා නොදීම යන සාධක ද මේ සඳහා බලපාන බව නිගමනයට බඳුන් විය.

අධ්‍යයනයන්ට සහභාගි වූ දත්ත දායකයන් හරහා ලබාගත් දත්ත විශ්ලේෂණයේ දී , පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රි නියෝජනය වර්ධනය සඳහා වඩාත්ම යෝග්‍ය නිර්දේශ කිහිපයක් අනාවරණය විය .සමීක්ෂණ දත්ත මත පදනම්ව දත්ත විශ්ලේෂණය කිරීමේ දී පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා වඩාත්ම යෝග්‍ය නිර්දේශය ලෙස ස්ත්‍රීන් සඳහා කෝටා ක්‍රමයක් හඳුන්වා දීම බව දත්ත දායකයන් 31කගේම අදහසයි. සෙසු නිර්දේශයන් ලෙස දේශපාලනික දැනුම, අත්දැකීම් හා පුහුණුව ලබාදීමට වැඩසටහන් සංවිධානය කිරීම., ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය අරමුණු කරගත් විශේෂිත ආයතන පිහිටුවීම, මැතිවරණ ක්‍රියාවලියට තරග වදින සෑම ස්ත්‍රියකට ම රජය විසින් මැතිවරණ කටයුතු සඳහා කිසියම් මුදලක් ලබාදීම, පක්ෂ නාමයෝජනා වලින් තුනෙන් එකක් ස්ත්‍රීන් සඳහා අනිවාර්ය කිරීම යනාදි ය ඉතිරි දත්ත දායකයන් 19 දෙනාගේ මතය විය.

සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් පසුව ශ්‍රී ලංකාවේ භාවිතා කළ මැතිවරණ ක්‍රමය වන්නේ සරල බහුතර නියෝජන ක්‍රමයයි. 1978න් පසු දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය සමඟ මැතිවරණය පවත්වන නියෝජන ක්‍රමයේ වෙනසක් සිදු කරන අතර වර්තමානය වන විට පවතින්නා වූ නියෝජන ක්‍රමය වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය යි. සමානුපාතික මැතිවරණ ක්‍රමය තුළ පවතින මනාප ක්‍රමය පක්ෂ අතරත්, පක්ෂ අභ්‍යන්තරයෙත් විශාල ගැටළු තත්ත්වයකට පත්ව ඇත. පවතින ක්‍රමය තුළ සෑම ඡන්ද අපේක්ෂකයෙකුට මැතිවරණ කටයුතු සඳහා විශාල වියදමක් දැරීමට සිදුව ඇති බොහෝ අවස්ථාවල නියෝජිතයෙකු වශයෙන් පත්වීමට නම් යම් ප්‍රමාණයකින් විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදුවෙයි. මැතිවරණ ප්‍රචාරණයේ දී පුළුල් ප්‍රචාරණයක් ලබා දීමට සිදුවේ. ස්ත්‍රී නියෝජිතයන්ට මෙම දේශපාලන සන්දර්භය තුළ නියෝජන අවස්ථා ලබාගැනීම බෙහෙවින් අභියෝගාත්මකය. එමෙන්ම ඉහත සමීක්ෂණ දත්ත මත පදනම්ව ද ස්ත්‍රී නියෝජිතයන්ට මෙම දේශපාලන සන්දර්භය තුළ නියෝජන අවස්ථා ලබාගැනීම බෙහෙවින් අසීරු බව තවදුරටත් පසක් වේ.

**නිගමන**

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතීමේ ගැටලුව නූතනයේ තීරණාත්මක සංධිස්ථානයක් බවට පත්ව තිබේ. 1931 සිට 2024 අභිනව පාර්ලිමේන්තුව දක්වා ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකය වන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය කිසිදු අවස්ථාවක සාධනීය මට්ටමක් කරා ළඟා වී නොමැත. ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකය තුළ පුරුෂ නියෝජනයට සාපේක්ෂව ස්ත්‍රී නියෝජනය අඩු අගයක් ගැනීම ලෝකයේ සෑම රටකටම ආවේණික කරුණක් වුවත් ශ්‍රී ලංකාවේ විශේෂත්වය වන්නේ ශ්‍රී ලංකාව තුළ මෙම පුරුෂ පරතරය හා ස්ත්‍රී නියෝජන පරතරය අතර විශාල පරතරයක් දක්නට වීමය. නොයෙකුත් සමීක්ෂණ දත්ත වාර්තාවලින් අනාවරණය වන ආකාරයට රාජ්‍යන් 187ක් අතරින් ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකය තුළ ස්ත්‍රී නියෝජනය දෙස බලන විට ශ්‍රී ලංකා පවතින්නේ 179ක් වෙනි ස්ථානයේ ය. 1931 සිට 2024 පාර්ලිමේන්තුව දක්වා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී නියෝජනය තුළ ලබාගෙන තිබෙන උපරිම නියෝජන ආසන සංඛ්‍යාව ආසන 22කි. 1989 සිට පාර්ලිමේන්තුවේ ආසන 225 කින් පාර්ලිමේන්තුව සමන්විත වූ අතර එහිදී පුරුෂ නියෝජන ප්‍රතිශතය හා බලන විට ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය 10% ක තරම් අවම අගයකි. නමුත් ශ්‍රී ලංකාවේ සමස්ත දේශපාලන නියෝජනය තුළ ස්ත්‍රියගේ පසුබෑසීම සැබැවින්ම ආන්දෝලනාත්මක කරුණක් බවට පත් ව තිබේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වැනි විධායක ජනාධිපතිවරු (කාන්තාවක් විසින් ) පාලනය හෙබ වූ රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාවේ මෙම පසුගාමීත්වය විමර්ශනාත්මක ලෙස අධ්‍යයනයට යොමු කළ යුතු කාරණාවකි. එමෙන්ම මෙහිදී විශේෂයෙන් ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බලන විට ශ්‍රී ලංකාවේ කාන්තාවගේ සාක්ෂරතා මට්ටම 91% කි. ආසියාතික කලාපයේ සංවර්ධන දර්ශක වලින් සාක්ෂරතා මට්ටමින් ඉහළම රාජ්‍ය වන්නේ ද ශ්‍රී ලංකාවයි. වෘත්තිය මට්ටමෙන් බලන විට ද දිසාපතිවරු, විශ්වවිද්‍යාලවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු, අග්‍රවිනිශ්චයකාරවරු මීට අමතරව වැදගත් පරිපාලන ධූරයන් රැසක් විධායක ක්ෂේත්‍රයේ හොබවන කාන්තාව දේශපාලනය තුළ පසුගාමීත්වය ක පවතී.

ශ්‍රී ලංකා ස්ත්‍රියට දේශපාලනයට නිරත වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා නෛතික හා හා විධිමත් නීති රෙගුලාසි පද්ධතියක් ද සම්පාදනය කර දී තිබේ. එහිදී ස්ත්‍රිය හා පුරුෂයා සමාන කොට දක්වා ඇති අතර පුරුෂයාට හිමි අයිතිවාසිකම් ස්ත්‍රියටත් ප්‍රදානය කර තිබේ. එමෙන්ම වනිතා කටයුතු අමාත්‍යංශය වැනි අමාත්‍යංශ පිහිටුවමින් ස්ත්‍රිය විෂයෙහි වර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ නෛතික පසුබිම තුළින් විධිවිධාන සකස් කර තිබේ. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී නියෝජනය ප්‍රවර්ධනය කළ නො හැක්කේ කවර සාධකයන් නිසා ද යන්න මෙහිදි ගැටලුකාරීය. මේ පිළිබඳව නොයෙකුත් චින්තකයන් විචාරකයන් හා පර්යේෂකයින් පර්යේෂණ සිදු කර තිබෙන අතර ඒ ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු සහ ක්ෂේත්‍ර අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණයේ දී පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රිය නූතනය වන විටත් පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනයෙහි ලා පසුගාමී තත්ත්වයක පැවතීමට කාරණා කිහිපයක් හේතු වී තිබෙන බවයි.

ඒ අතරින් ප්‍රධාන වශයෙන්ම දේශපාලන ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රිය කෙරෙහි දක්වන සමාජ හා සංස්කෘතික ආකල්ප ,පවතින මැතිවරණ ක්‍රමය ,දේශපාලන පක්ෂ පුරුෂ මූලික වීම, පුරුෂාධිපත්‍ය සහිත රාජ්‍යයක් වීම ,ස්ත්‍රියට පවතින ආර්ථික දුෂ්කරතාවයන් යනාදී කරුණු මූලික වී තිබේ. එහි දී විශේෂයෙන්ම ශ්‍රී ලාංකේය ස්ත්‍රිය පෙරදිග සංස්කෘතියක් සහිත බුද්ධාගමට නැඹුරු වූ ස්ත්‍රියක් වන අතර එහිදී සමාජ ක්‍රියාකාරකම් හෝ දේශපාලන ක්‍රියාකාරකම් වල නිරත වීම පුරුෂයා සතු කාර්යයක් වන බවත්, එය ස්ත්‍රීන්ට අකැප වන බවටත් සාම්ප්‍රදායික මතයක් පවතින අතර නූතනය වන විටත් එම තත්වය බැහැර කිරීමට අපොහොසත් වී තිබේ. ග්‍රාමීය ප්‍රදේශවල මෙම තත්ත්වය නගරාසන්න ප්‍රදේශවලට සාපේක්ෂව තවදුරටත් වැඩි ය. මෙවැනි තත්ත්වයක් තුළ ශ්‍රී ලාංකේය ස්ත්‍රිය දේශපාලනයට පිවිසීමට මැලිකමක් දක්වන අතර දේශපාලනය තුළ නිරත වීම පුරුෂයා සතු කාර්යයක් වන බව සිතයි.

එමෙන්ම දේශපාලන ප්‍රචණ්ඩත්වය ද ශ්‍රී ලංකාවේ කාන්තාවගේ ස්ත්‍රී නියෝජනය විෂයෙහි බෙහෙවින් බලපා තිබේ. පුරුෂයා සමග කරට කර තරඟ වැදීමට කාන්තාව අපොහොසත් ය. එයට හේතුව මෙරට පවතින දේශපාලන ප්‍රචණ්ඩත්වය යි .විශේෂයෙන්ම මැතිවරණ කාලයන්හිදී මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපෘති තුළ නොයෙකුත් දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා ඇතැම් විට මිනිස් ඝාතන ද දක්නට ලැබේ. විශේෂයෙන්ම චරිත ඝාතනය ආදී ක්‍රියාකාරකම් සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කිරීමට බොහෝ අපේක්ෂකයින් පෙළඹී තිබේ. ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතියක් තුළ ස්ත්‍රියට මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපෘතියක් දියත් කිරීම පුරුෂයාට සාපේක්ෂව විශාල පෞරුෂයක් අවශ්‍ය

වේ. එමෙන් ම ආර්ථික අතින්ද ශ්‍රී ලංකාවේ කාන්තාව නොදියුණු මට්ටමක පවතින අතර බොහෝ විට සැමියාගෙන් යැපෙන මට්ටමක් පවතී. රැකියාවක් කළ ද ලැබෙන වැටුප පුරුෂයාට සාපේක්ෂව අඩු ය. ආර්ථික දුෂ්කරතාව යන සාධකය මත බොහෝ කාන්තාවන් දේශපාලනයට පිවිසීම ප්‍රතික්ෂේප කරයි. පරම්පරාගත බූදලයක් නොඑසේනම් නොමසුරුව වියදම් කල හැකි මුදල් ප්‍රමාණයක් සහිත ආර්ථිකයකට හිමිකම් කිව යුතු ය.

පවතින මැතිවරණ ක්‍රමය හා නියෝජන ක්‍රමය දෙස බැලීමේදී ද පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රියට පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීමේ දී එම පවතින මැතිවරණ ක්‍රමය නියෝජන ක්‍රමය අවාසිදායක වන බව යි. එනම් ලොකයේ රාජ්‍යයන් දෙස අවධානය යොමු කිරීමේ දී පෙනී යන කාරණයක් වන්නේ සෑම රාජ්‍යයක්ම කාන්තාවන්ට දේශපාලන නියෝජන ලබාදීමේ දී විශේෂ ක්‍රම අනුගමනය කර තිබෙන බවයි. එහිදී කෝටා ක්‍රමය හඳුන්වා දීම විශේෂ වන අතර ඒ හරහා ස්ත්‍රියගෙ  නියෝජනය වර්ධනය කිරීමට කටයුතු කර තිබේ. ලෝක මට්ටමින් මෙන්ම කලාපීය මට්ටමින් මෙම රාජ්‍යයන්වල ස්ත්‍රී දේශපාලන නියෝජනය පිළිබඳව විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීමේ දී මේ බව පසක් කර ගැනීමට හැකිය.

ඊට අමතරව ශ්‍රී ලංකාවේ පවතින දේශපාලන පක්ෂ පුරුෂ මූලික වීම ද මේ සඳහා බෙහෙවින් බලපා තිබේ. එහිදී විශේෂයෙන් පවතින දේශපාලන පක්ෂ වැදගත් නිලතල සියල්ල ම පුරුෂයන් වටා කේන්ද්‍ර කොටගෙන තිබේ. ස්ත්‍රියට දේශපාලන පක්ෂයන් තුළ ප්‍රමුඛ පෙළේ තනතුරු නොලැබේ. එහි දී දේශපාලන පක්ෂවල ප්‍රධාන තනතුරු සියල්ල ම පුරුෂ පක්ෂය වටා සංකේන්ද්‍රණය වී ඇති අතර කාන්තාව නොවැදගත් තත්ත්වයකට දේශපාලන පක්ෂ විසින් ම පත් කර තිබේ. මීට අමතරව මෙරට පවතින කාන්තාව අද්දැකීම් සහ පුහුණුව අඩුවීම නිසා දේශපාලන ක්ෂේත්‍රය තුළ නියෝජනය අවස්ථා ලබාගැනීමටත්, නියෝජන අවස්ථා ලබා ගත්තත් දේශපාලන ක්ෂේත්‍රය තුල ස්ථිර වශයෙන් රැඳී සිටීමටත් ඇයට මේ හේතුවෙන් අවස්ථාවක් නැත. මෙහිදී විශේෂයෙන් ම අධ්‍යාපනික මට්ටමින් හා වෘත්තිය මට්ටමෙන් පරිණත වුව ත් දේශපාලනය යනු ඊට හාත්පසින් ම වෙනස් දෙයකි. මේ සඳහා දේශපාලනික වශයෙන් සවිඥානික වීමත් ,ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් මෙන්ම අත්දැකීම් පළපුරුද්ද ව තිබිය යුතු ය.

ශ්‍රී ලංකාවේ වෙනත් රටවලට සාපේක්ෂව කාන්තාවන්ට දේශපාලන නායකත්වය පිළිබඳ සංවර්ධන පුහුණු වැඩසටහන්, උපදෙස් ලබා දෙන ආයතන වල හිඩසක් ද දක්නට ලැබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී 1931 සිටම 2020 පාර්ලිමේන්තු දක්වා ම නියෝජන අවස්ථා ලබා ගැනීමේ දී දේශපාලන පවුල් පසුබිම ඉවහල් වී තිබේ. 2024 දී තරමක් මෙම තත්ත්වය පහ ව ගොස් ඇත. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ ප්‍රථම අගමැතිනිය බවට පත් වන්නේ සැමියාගේ දේශපාලන ආභාෂයෙනි. එමෙන්ම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මෙරට විධායක ජනාධිපතිනිය බවට පත්වන්නේ ද  මව ,පියා දෙපළම දේශපාලනයේ නිරත වූ අය නිසාය.
මෙම ආකාරයට අතීතයේ පටන්  ම නියෝජනය අවස්ථා ලබාගැනීමේදී දේශපාලන පවුල් පසුබිම ස්ත්‍රීන්ට දේශපාලන නියෝජනයෙ දී ප්‍රමුඛ සාධකයක් බවට පත් වී තිබේ.  .ඒ අනුව දේශපාලනික සවිඥානිකත්වය හා උගත්, බුද්ධිමත්භාවය හෝ වෘත්තීය නිපුණත්වය ආදී කරුණු කාරණා මත ස්වාධීනව දේශපාලන කරළිය තුළ තරග වදිමින් දේශපාලන අවස්ථා ලබා ගැනීම ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය තුළ තවමත් අසීරු තත්වයකි. මෙම තත්වය වර්තමාන 2024 පාර්ලිමේන්තුවන විට තරමක් අඩු වී  තිබේ.

එමෙන්ම ස්ත්‍රීන් සඳහා ඡන්දය ලබා දීමට බොහෝ විට ඡන්දදායකයන් උත්සාහ නොගන්නා තත්ත්වයක් ද  උද්ගත ව තිබේ. එහි දී විශේෂයෙන් ම රංගන ශිල්පිනියන් , රූප රාජිනියන් වැනි අය කාන්තා දේශපාලනයට පැමිණ ඡන්දය ලබා ගෙන පාර්ලිමේන්තු නියෝජනය ලබාගත්ත ද කෙටි කාලයක් තුළ ජනතා අප්‍රසාදය ඔවුන්  වෙත පළ කිරීම හේතුවෙන් මුළු කාන්තා සංහතියම හෑල්ලුවට ලක් වී තිබේ. එහි දී කිසිදු කාන්තාවක් කෙරෙහි විශ්වාසය තබමින් ඡන්දය ලබා දීමට ඡන්දදායකයන් පෙළඹෙන්නේ නැත. මෙම කාරණයද සෘජුවම ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පසුගාමී තත්ත්වයක පැවතීමට හේතු වී තිබේ.
මීට අමතරව කාන්තාවක් තවත් කාන්තාවක් ඉදිරියට ගෙන ඒමට ඡන්දය ලබා දීමට ද මැලිකමක් දක්වයි. එහිදී විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළ ඇතැම් විට, එක් කාන්තාවක් තමන්ට වඩා ඉදිරියට යාම තවත් කාන්තාවක්  දැකීමට අකමැති ය. මෙවැනි කරුණු කාරණා ද මෙම තත්වය සඳහා පසුබිම වන්නට ඇත. සමස්තයක් ලෙස ගත් කළ මේ

ආකාරයට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ තවමත් ස්ත්‍රී නියෝජනය පසුගාමී මට්ටමක පැවතීමට මෙවැනි කරුණු කාරණා බලපාන්නට ඇති බව ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීමේ දී නිගමනය කළ හැකිය.

**යෝජනා**

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පසුගාමී තත්ත්වයක පවතින අතර එය සාධනීය මට්ටමක් කරා ගෙන යෑම අපහසු කාර්යයක් බවට පත්ව තිබේ. ඒ සඳහා ශක්තිමත් යෝජනා ඉදිරිපත් කිරීම ද අපහසු නමුත් කෙමෙන් කෙමෙන් හෝ ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය කර ගැනීමට මෙම යෝජනාවන් රුකුලක් වනු ඇත.

කෝටා ක්‍රමයක් හඳුන්වා දීම. මෙහිදී ආසන වෙන්කිරීමේ දී යම් ආසන ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතුය. එහි දී 25% ක් හෝ පාර්ලිමේන්තුවේ මුළු ආසන සංඛ්‍යාවෙන් 1/3 ක් ස්ත්‍රීන් සඳහා නියෝජනය වන ආකාරයට කෝටා ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. පක්ෂ නාමයෝජනා වලින් 1/3 ක් අනිවාර්යෙන්ම ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු ය. මැතිවරණයට තරග කිරීමේ දී පක්ෂ නාමයෝජනා වලින් 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ විට අනිවාර්යෙන් ඡන්ද දායකයන් තම මනාප තුනෙන් එකක්වත් ස්ත්‍රී අපේක්ෂකයෙකුට පළ කිරීමට පෙළඹේ. ස්ත්‍රීන්ට දේශපාලන දැනුම, අත්දැකීම් හා පුහුණුව ලබාදීමට වැඩසටහන් සංවිධානය කිරීම.ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය අරමුණු කරගත් විශේෂිත ආයතන පිහිටුවීම. මැතිවරණ ක්‍රියාවලියට තරග වදින සෑම ස්ත්‍රියකට ම රජය මගින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා කිසියම් මුදලක් ලබා දීම. මෙහිදී ස්ත්‍රියගේ ආර්ථික මට්ටම පුරුෂයාට සාපේක්ෂව අඩු නිසා ස්ත්‍රීන්ට දේශපාලනයට ප්‍රවේශ වීමේ දී ආර්ථික දුෂ්කරතා මගහරවා ගැනීමට ස්ත්‍රී අනපේක්ෂකයින්ට පමණක් රජය විසින් කිසියම් මුදලක් මැතිවරණ කාල සීමාවන් වලදී ලබාදීම හරහා ස්ත්‍රීන් ධෛර්‍යමත් කළ හැක. දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය හරහා කාන්තාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පහසු බවත්, දියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රටක ස්ත්‍රී නියෝජනය පුරුෂ නියෝජනයට සාපේක්ෂව පැවතිය යුතු බවත් ,ශ්‍රී ලංකාව දියුණු දේශපාලන සංස්කෘතියක් බවට පත්කිරීමට නම් ස්ත්‍රී නියෝජනයේ වර්ධනය අනිවාර්ය බවත් ඡන්දදායකයන් දැනුවත් කිරීම හරහා ස්ත්‍රී නියෝජනය පාර්ලිමේන්තුව තුළ වර්ධනය කළ හැකිය. දේශපාලන පක්ෂ තනතුරු හා කමිටු නියෝජිතයින්ගෙන් පංගුවක් ස්ත්‍රීන්ට වෙන් කිරීම ද මෙහිදී වැදගත් ය. ස්ත්‍රීන්ට නාමයෝජනා ලබා දීමේ දී සමස්ත ස්ත්‍රී ප්‍රජාව ම හැල්ලුවට ලක් නොකරන දේශපාලනික සවිඥානය සහිත උගත් කාන්තාවන්ට පමණක් නාමයෝජනා ලබා දීම ද කළ යුතු වන්නකි.. ජාතික ලැයිස්තුව හරහා නියෝජිතවරියන් තෝරා පත් කර ගැනීමේ දී සෑම දේශපාලන පක්ෂයක් විසින් ම එහි දී අධ්‍යාපනික මට්ටම, වෘත්තිය මට්ටම ආදිය සලකා බලමින් පක්ෂ අනුග්‍රාහකත්වය මත පදනම් නොවී උගත් පරිණත කාන්තාවන් පත්කර ගැනීම ද ස්ත්‍රී නියෝජනය පාර්ලිමේන්තුව තුළ වර්ධනයට ඉවහල්වන සාධකයකි. සමස්තයක් ලෙස ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා යෝග්‍ය නිර්දේශයන් ලෙස සමීක්ෂණ දත්ත මත පදනම් ව මේවා සඳහන් කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


උයන්ගොඩ, ජයදේව (2010) සමාජයේ අපි ඔක්කොම සමානයි ,පුරවැසිභාවය දේශපාලන න්‍යාය සහ භාවිතය, කොළඹ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

ජයවර්ධන, කුමාරි (2004) ,ස්ත්‍රීවාදය සහ ජාතිකවාදය කොළඹ පහ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

ජයසිංහ, ඒ. කේ. පී (2000) ස්ත්‍රී පුරුෂ සමාජභාවය, කඩවත, කඩුල්ල ප්‍රකාශන

ජයසේකර ,ගුණපාල, මැති සබේ යට ගිය තොරතුරු, ගොඩගේ ප්‍රකාශකයෝ

ජයසේන, චන්දිමා (2011) ,පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ කාන්තාවගේ තත්වය හා අනාගතය, ලක්බිම කොළඹ ,සුමති ප්‍රකාශකයෝ

මඩහපොළ, තුෂාරි (2004), ශ්‍රී ලංකාවේ දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය , සූරිය ප්‍රකාශකයෝ

මනුරත්න, එම්. පී (2004) , ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පවුල, වරකාපොල ,ආරිය ප්‍රකාශකයෝ

ලියනගේ, කමලා (2012), ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජනය සමාන ද? පංගු ක්‍රම න්‍යාය සහ භාවිතය, ෆෙඩ්රිච් ඒබට් ප්‍රකාශනය

ලියනගේ, කමලා (2000), ශ්‍රී ලාංකික කාන්තාව: ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පුරවැසි බව හා දේශපාලන නියෝජනය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ලියනගේ, කමලා (1998), ශ්‍රී ලංකා දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය, කොළඹ, ෆෙඩ්රිච් ඒබට් පදනම

ලියනගේ. කේ සහ වළාකුළුගේ. එස් (2006 ) ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය, කොළඹ, ෆෙඩ්රිච් ඒබට් පදනම